**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**

**பொலிஸ் ஊடகப் பிரிவு**

**POLICE MEDIA DIVISION**

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.04.12 පැය 0535 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 596/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු.</u>

**பொலிஸ் ஊடகப் பிரிவுக்கு கிடைத்த முக்கிய தகவல்கள்**

**01. මනුෂ්‍ය ඝාතනයක් - හොරණ පොලිස් වසම.**

2026.04.11 වන දින අළුයම හොරණ පොලිස් වසමේ මල්වානේගම ප්‍රදේශයේ පුද්ගලයෙකු තියුණු ආයුධයකින් පහරදීම හේතුවෙන් තුවාල ලබා හොරණ රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට හොරණ පොලිස් ස්ථානය වෙත ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 46 ක් වූ පෝරුවදණ්ඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු සහ අසල්වාසී පුද්ගලයෙකු සමඟ ඇතිවූ පුද්ගලික ආරවුලක් හේතුවෙන් එම පුද්ගලයා විසින් තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. වයස අවුරුදු 32 ක් වන සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

මෘත ශරීරය හොරණ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර හොරණ පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

***மனிதப் படுகொலை – ஹொரணை பொலிஸ் பிரிவு***

*2026.04.11 அன்று அதிகாலை ஹொரணை பொலிஸ் பிரிவின் மல்வானேகம பகுதியில் ஒருவர் கூரிய ஆயுதத்தால் தாக்கப்பட்டு காயமடைந்த நிலையில் ஹொரணை மருத்துவமனையில் அனுமதிக்கப்பட்ட பின்னர் உயிரிழந்துள்ளார் என தகவல் கிடைத்ததை அடுத்து ஹொரணை பொலிஸார் விசாரணையை ஆரம்பித்துள்ளனர்.*

***மரணமானவர் 46 வயதுடைய போருவதண்ட பகுதியைச் சேர்ந்தவர்.***

*விசாரணையில், அண்டை வீட்டாருடன் ஏற்பட்ட தனிப்பட்ட தகராறு காரணமாக 32 வயதுடைய சந்தேகநபர் கூர்மையான ஆயுதத்தால் தாக்கி இக் கொலை செய்ததாக தெரியவந்துள்ளது. சந்தேகநபர் கைது செய்யப்பட்டுள்ளார்.*

*சடலம் ஹொரணை மருத்துவமனை பிரேத அறையில் வைக்கப்பட்டுள்ளதுடன் மேலதிக விசாரணைகள் நடைபெற்று வருகின்றன.*

## 02. විදුලිසැර වැදී පුද්ගලයකු මියයාමක් - කොක්අඩිචෝලය පොලිස් වසම.

2026.04.11 වන දින උදෑසන කොක්අඩිචෝලය පොලිස් වසමේ තාන්තාමලය ප්‍රදේශයේදී පුද්ගලයකුට විදුලිසැර වැදීමෙන් මියගොස් ඇති බවට කොක්අඩිචෝලය පොලිසියට ලද පණිවිඩයක් සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 58 ක් වූ තාන්තාමලය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තම වගාවට ජලය යෙදීම සඳහා විදුලි මෝටරය සවිකිරීමට යාමේදී විදුලි සැර වැදී ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය මඩකලපුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කරඇත.

කොක්අඩිචෝලය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරයි.

### மின்சாரம் தாக்கி மரணம் – கொக்கட்டிச்சோலை பொலிஸ் பிரிவு

2026.04.11 காலை வேளையில் கொக்கட்டிச்சோலை பொலிஸ் பிரிவின் தாந்தாமலை பகுதியில் ஒருவர் மின்சாரம் தாக்கி உயிரிழந்துள்ளார் என கிடைத்த தகவலின் பேரில் விசாரணை ஆரம்பிக்கப்பட்டுள்ளது.

**மரணமானவர் 58 வயதுடைய தாந்தாமலை பகுதியைச் சேர்ந்தவர்.**

தனது விவசாய நிலத்திற்கு நீர் வழங்க மின்மோட்டார் பொருத்தும் போது மின்சாரம் தாக்கியதாக விசாரணையில் தெரியவந்துள்ளது. சடலம் மட்டக்களப்பு மருத்துவமனை பிணவறையில் வைக்கப்பட்டுள்ளது.

## 03. ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වලාන මධ්‍යම දූෂණ මර්ධන ප්‍රහාරක ඒකකය.

2026.04.11 දින සවස පමුණුගම පොලිස් වසමේ නුගපේ ප්‍රදේශයේදී වලාන මධ්‍යම දූෂණ මර්ධන ප්‍රහාරක ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධි මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා ලීටර් 2646 ක් (බැරල් 14 ක් ) සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පමුණුගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 58 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පමුණුගම පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### கோடா உடன் ஒருவர் கைது – வலான மத்திய ஊழல் தடுப்பு பிரிவு

2026.04.11 அன்று பிற்பகல் பமுனுகம பொலிஸ் பிரிவின் நுகபே பகுதியில் மேற்கொள்ளப்பட்ட சோதனையில், சட்டவிரோத மதுபான உற்பத்திக்காக பயன்படுத்தப்படும் 2646 லீட்டர் கோடா (14 பெரல்கள்) உடன் ஒருவர் கைது செய்யப்பட்டார்.

சந்தேகநபர் 58 வயதுடைய வெல்லம்பிட்டிய பகுதியைச் சேர்ந்தவர். மேலதிக விசாரணைகள் பமுனுகம பொலிஸாரால் மேற்கொள்ளப்படுகின்றன.

**04. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2026.04.11 දින සවස මීගමුව පොලිස් වසමේ මන්ත්‍රිවත්ත ප්‍රදේශයේදී මීගමුව කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 57 ක් (බෝතල් 76 ක් ) සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන මීගමුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 40 ක් වන දළුපොත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීගමුව පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

***சட்டவிரோத மதுபானத்துடன் ஒருவர் கைது – நீர்க்கொழும்பு பிரிவின் குற்றவியல் விசாரணைப் பணியகம்.***

*2026.04.11 அன்று மாலை நீர்க்கொழும்பு பொலிஸ் பிரிவின் மந்திரிவத்த பகுதியில் மேற்கொள்ளப்பட்ட சோதனையில், 57 லீட்டர் (76 பாட்டில்கள்) சட்டவிரோத மதுபானத்துடன் நீர்க்கொழும்பு பிரிவின் குற்றவியல் விசாரணைப் பணியகத்தினால் ஒருவர் கைது செய்யப்பட்டுள்ளார். சந்தேக நபரும் கைப்பற்றப்பட்டபொருட்களுடன் நீர்க்கொழும்பு பொலிஸ் நிலையத்தில் ஒப்படைக்கப்பட்டுள்ளனர்.*

*சந்தேகநபர் 40 வயதுடைய தலுபொத பகுதியைச் சேர்ந்தவர்.*

*நீர்க்கொழும்பு பொலிசார் மேலதிக விசாரணைகள் நடைபெற்று வருகின்றன.*

**05. යතුරුපැදියක් ලොරි රථයක ගැටී යතුරුපැදිකරු ජීවිතක්ෂයට - සීදූව පොලිස් වසම.**

2026.04.11 දින රාත්‍රී සීදූව පොලිස් වසමේ සීදූව කොටුගොඩ මාර්ගයේ කිලෝමීටර් 03 කණුව ආසන්නයේදී කොටුගොඩ දෙසට ධාවනය වූ යතුරුපැදියක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු බරපතල තුවාල ලබා සීදූව විජය කුමාරතුංග රෝහලට ඇතුළත් කරන විටත් මියගොස් සිට ඇත.

**මරණකරු වයස අවුරුදු 19 ක් වූ මීගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුරට සම්බන්ධ ලොරි රථයේ රියැදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර සීදූව පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

***மோட்டார் சைக்கிள்-லாரி மோதல்; இளைஞர் உயிரிழப்பு – சீதுவ பொலிஸ் பிரிவு***

*2026.04.11 இரவு சீதுவ-கொட்டுகொட வீதியில் மோட்டார் சைக்கிள் ஒன்று எதிர்திசையில் வந்த லாரியுடன் மோதியதில் விபத்து ஏற்பட்டுள்ளது.*

இந்த விபத்தில் 19 வயதுடைய மீகொட பகுதியைச் சேர்ந்த இளைஞர் பலத்த காயமடைந்து மருத்துவமனையில் அனுமதிக்கப்பட்டபோது உயிரிழந்துள்ளார்.

லாரி ஓட்டுநர் கைது செய்யப்பட்டுள்ளார். சீதுவ பொலிஸார் மேலதிக விசாரணைகளை மேற்கொள்கின்றனர்.

**பொலிஸ் ஊடகப் பிரிவு**